# ද මැසිනොද් විදුහල - කඳාන

## පුරවැසි අධ්‍යාපනය
## 11 වසර
## II වාර පරීක්ෂණය

24 - 07 - 2019

නම :- ................................................. පන්තිය :-................ පන්ති අංකය :-................

- වඩාත් නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

01. නීතිය යනු "රාජ්‍යය විසින් ක්‍රියාවට නංවනු ලබන අයිතිවාසිකම් සහ බැඳීම් පිළිබඳ පද්ධතියකි. මෙය ප්‍රකාශ කරනු ලැබුවේ,

i) ටී.එච්.ග්‍රීන්ය ii) ජෝන් ඔස්ටින්ය iii) හැරල්ඩ් ලැස්කිය iv) ඇරිස්ටෝටල්ය

02. නීතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ,

i) සමාජ සුභසාධනය සිදුකිරීමය
ii) සමාජය තුළ සාධාරණත්වය තහවුරු කිරීමය
iii) මානව හැසිරීම් පාලනය කිරීම තුළින් යුක්තිය ඇති කිරීමය
iv) ධර්මිෂ්ඨ සමාජයක් ගොඩනැගීමය

Learning Resource Center
R
De Mazenod College
Kandana

03. නීතියේ මූලාශ්‍රයක් නොවන්නේ,

i) අධිකරණ තීන්දුව ii) සිරිත් විරිත්ය iii) පාරම්පරික මතවාදයන් ය iv) ආගමය

04. අපරාධ නීතියට අනුව දඬුවම් ලැබිය හැකි බරපතල වරදක් නොවන්නේ,

i) දේපල සොරකම් කිරීම
ii) පොදු දේපලවලට හානි කිරීම
iii) නීත්‍යානුකූලව ධනය ඉපැයීම
iv) ස්ත්‍රී දූෂණය

05. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ දී,

i) අධිකරණ පද්ධතිය අවිධිමත් කිරීමට කටයුතු කරන ලදී
ii) අධිකරණ පද්ධතිය විධිමත් කිරීමට කටයුතු කරන ලදී
iii) ප්‍රධාන අධිකරණ දිස්ත්‍රික්ක තුනක් යටතේ ක්‍රියාත්මක විය
iv) ගම් සභා ක්‍රමය ද දිගටම පවත්වා ගෙන යනු ලැබීය

06. ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය තුළ ඉහළ අධිකරණ ආයතනයක් ලෙස දැක්විය හැක්කේ,

i) අභියාචනාධිකරණය
ii) මහාධිකරණය ය
iii) පළාත්බඳ මහාධිකරණය
iv) දිසා අධිකරණය ය

07. වානිජ ආරවුල් විසඳීම, පළාත් සභාව තුළ රිට් ආඥා නිකුත් කිරීම, පළාත් සභාව තුළ හබසාස් කෝපුස් රිට් ආඥා ලබාදීම යනාදි අධිකරණ බලතල හිමිවන්නේ,

i) ප්‍රාථමික උසාවි වලටය
ii) පළාත්බඳ මහාධිකරණ වලටය
iii) දිසා අධිකරණ වලටය
iv) මහේස්ත්‍රාත් අධිකරණ වලටය

08. රජයේ හා රාජ්‍ය ආයතන සම්බන්ධව නඩුවලට රජය වෙනුවෙන් පෙනී සිටීම සිදු කරනු ලබන්නේ,

i) අගවිනිසුරුතුමාය
ii) රජයේ ජ්‍යෙෂ්ඨ අධිනීතිඥවරුන්ය
iii) නීතිපතිතුමාය
iv) රජයේ අධිනීතිඥවරුන්ය

09. ඔම්බුඩ්ස්මන් තනතුර හඳුන්වා දෙනු ලැබුවේ,

i) 1947 ව්‍යවස්ථාව මඟිනි
ii) 1931 ඩොනමෝර් වයවස්ථාව මඟිනි
iii) 1972 ව්‍යවස්ථාව මඟිනි
iv) 1978 ව්‍යවස්ථාව මඟිනි

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය

i) ලංකාවේ උත්තරීතර නීතිය වේ
ii) ලංකාවේ අනු නීතියකි
iii) ලංකාවේ අත්‍යවශ්‍ය නොවන නීතියකි
iv) ලංකාවේ නොවැදගත් නීතියකි

11. අධිකරණ සේවා කොමිසම සමන්විත වන්නේ,

i) සාමාජිකයින් 5 දෙනෙකුගෙනි
ii) සාමාජිකයින් 4 දෙනෙකුගෙනි
iii) සාමාජිකයින් 3 දෙනෙකුගෙනි
iv) සාමාජිකයින් දෙදෙනෙකුගෙනි

12. අප්‍රමාදව හා අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා සිදුවිය හැකි අවාසිදායක තත්ත්වයක් වන්නේ,

i) රටතුළ සිදුවන අපරාධ හා දූෂණ වර්ධනය නොවීම
ii) රට තුළ නීතියේ සමානාත්මතාව හා සාධාරණත්වය පිරිහීම
iii) මිනිසුන් තුළ අධිකරණයට හා නීතියට ඇති ගෞරවය වර්ධනය වීම
iv) නීතිය වෙනුවට අවනීතිය ඉදිරියට ඒම

13. ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ඉතිහාසයේ මුල්ගල ලෙස සැලකිය හැක්කේ,

i) 1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රමය ය
ii) 1910 මැකලම් ආණ්ඩුක්‍රමය ය
iii) 1920 මැනිං ආණ්ඩුක්‍රමය ය
iv) 1924 මැනිං ඩෙවන්ෂයර් ආණ්ඩුක්‍රමය ය

14. ලංකා ආණ්ඩුක්‍රම ඉතිහාසයේ මුල්වරට සීමිත ඡන්ද ක්‍රමය හඳුන්වා දෙනු ලැබුවේ,

i) 1931 ආණ්ඩුක්‍රමයෙනි
ii) 1920 ආණ්ඩුක්‍රමයෙනි
iii) 1910 ආණ්ඩුක්‍රමයෙනි
iv) 1924 ආණ්ඩුක්‍රමයෙනි

24.07.2019
11 ශ්‍රේණිය
පුරවැසි.

15. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමය තුළින් ලංකාවට ලැබුණේ,

i) පූර්ණ නිදහස් තත්ත්වයකි
iii) ස්වාධීන සෛවරි නිදහස් ජනරජ තත්ත්වයකි
ii) අර්ධ නිදහස් තත්ත්වයකි
iv) මින් කිසිවක් පිළිගත නොහැක

16. 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව මගින් හඳුන්වා දෙනු ලැබූ ව්‍යවස්ථාදායකය හඳුන්වා දෙනු ලැබුවේ,

i) පාර්ලිමේන්තුව නමිනි
iii) ඒකමාණ්ඩලික ව්‍යවස්ථාදායකය නමිනි
ii) ජාතික රාජ්‍ය සභාව නමිනි
iv) ද්විමාණ්ඩලික ව්‍යවස්ථාදායකය නමිනි

17. 1978 ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙනු ලැබූ නියෝජන ක්‍රමය වූයේ,

i) සරල බහුතර නියෝජන ක්‍රමයය
iii) සමානුපාතික නියෝජන ක්‍රමයය
ii) කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමයය
iv) මිශ්‍ර නියෝජන අනුපාත ක්‍රමයය

18. ව්‍යවස්ථාදායකයට අයත් කාර්යයක් නොවන්නේ,

i) නීති පැනවීම ii) අයවැය පාලනය iii) ප්‍රශ්න ඇසීම iv) නීති විවරණය කිරීම

19. 1978 ව්‍යවස්ථාදායකය සඳහා ජාතික ලැයිස්තුවෙන් තේරීපත් වන මන්ත්‍රීන් සංඛ්‍යාව

i) 25 කි ii) 27 කි iii) 28 කි iv) 29 කි

20. මහා නගර සභා, නගර සභා. ප්‍රාදේශීය සභා අයත් වන්නේ,

i) මධ්‍යම ආණ්ඩුවේ ආයතන වලට ය
iii) පළාත් සභා අන්බද්ධ ආයතන වලට ය
ii) පළාත් පාලන ආයතන වලට ය
iv) රාජ්‍ය ආයතන වලට ය

21. 2015 වන විට ලංකාවේ මුළු පළාත් පාලන සංඛ්‍යාව,

i) 452 කි ii) 335 කි iii) 533 කි iv) 665 කි

22. මිනිසත්බව ලැබීම හේතුකොට ගෙන පුද්ගලයෙකුට උපතින්ම ලැබෙන අයිතීන්,

i) මූලික අයිතිවාසිකම් ලෙස දක්විය හැක
iii) සිවිල් අයිතිවාසිකම් ලෙස දක්විය හැක
ii) මානව අයිතිවාසිකම් ලෙස දක්විය හැක
iv) දේශපාලන අයිතිවාසිකම් ලෙස දක්විය හැක

23. මානව අයිතිවාසිකම් බිහිසුණු ලෙස උල්ලංඝනය වූ ප්‍රබල අවස්ථාවකට නිදසුනක් ලෙස දක්විය හැක්කේ,

i) සිවිල් යුද්ධය
iii) අන්තර් රාජ්‍ය ගැටුම් ය
ii) රට අභ්‍යන්තරයේ සිදුවන කැරළිය
iv) ලෝක සංග්‍රාමයන් ය

Learning Resource Center
R
De Mazenod College
Kandana

24. දේශපාලන අයිතිවාසිකමක් නොවන්නේ,

i) ඡන්දය පාවිච්චි කිරීමට ඇති අයිතිය

ii) මැතිවරණය සඳහා නියෝජිතයෙක් ලෙස ඉදිරිපත් වීමේ අයිතිය

iii) මැතිවරණ කටයුතු සංවිධානය කිරීමේ අයිතිය

iv) පෞද්ගලික දේපල දැරීමට ඇති අයිතිය

25. වයස අවු. 18 ට අඩු සෑම මනුෂ්‍යයකුම ළමයකු ලෙස සලකන්නේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ

i) පළමුවන වගන්තියට අනුවය

ii) දෙවන වගන්තියට අනුවය

iii) තුන්වන වගන්තියට අනුවය

iv) හතරවන වගන්තියට අනුවය

26. ළමා අයිතිවාසිකම් සුරැකීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියා මාර්ගයක් නොවන්නේ,

i) පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පිහිටුවීම

ii) ශ්‍රී ලංකා ළමා දුරකථන සේවයක් පිහිටුවීම

iii) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවීම

iv) ළමා උද්‍යාන සහ සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීම

27. වැඩ කරන ජනතාව වෙනුවෙන් සමාජ සාධාරණත්වය ඉටු කිරීම අරමුණු කරගෙන අන්තර් ජාතික කම්කරු සංවිධානය පිහිටුවනු ලැබුවේ,

i) 1917 දී ය ii) 1918 දී ය iii) 1919 දී ය iv) 1920 දිය

28. පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ආයතනයක් හෝ දෙපාර්තමේන්තුවක් නොවන්නේ,

i) පරිසර අමාතයාංශය

ii) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

iii) වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව

iv) ඉඩම් අමාත්‍යාංශය

29. ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයක් ව්‍යවස්ථාවට ඇතුළත් කරනු ලැබුවේ,

(i) 1947 ව්‍යවස්ථාව තුළිනි

(ii) 1931 ව්‍යවස්ථාව තුළිනි

iii) 1972 ව්‍යවස්ථාව තුළිනි

iv) 1978 ව්‍යවස්ථාව තුළිනි

30. ලොවපුරා විසිරී සිටින ජනගහනයෙන් __________ ප්‍රමාණයකට ආරක්ෂිත ජලය සඳහා නිම්කම අහිමි වී ඇත.

i) 20% ii) 18% iii) 22% iv) 24%

(ලකුණු 1 x 30 = 30 )

- කෙටි පිළිතුරු සපයන්න.

(1) නීතිය යනු කුමක්ද?

(2) යුක්තිය යනු කුමක්ද?

(3) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පොදු නීතිය කුමක්ද?

(4) වර්තමානයේ උතුරු පළාතේ හා මන්නාරම් දිස්ත්‍රික්කයේ පදිංචි දෙමළ වැසියන්ට සීමා වී ඇති නීතිය කුමක්ද?

(5) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය තුළ ඉහළම අධිකරණ ආයතනය වන්නේ කුමක්ද?

(6) අධිකරණයේ ස්වාධීනත්වය රැක ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කර ඇති ප්‍රතිපාදනයන් දක්වන්න.

(7) අප්‍රමාදව පහ අපක්ෂපාතීව යුක්තිය පසිඳලීම සිදු නොවීම නිසා ඇතිවිය හැකි අවාසිදායක ප්‍රත්ඵලයක් දක්වන්න.

(8) ලංකාවේ දිස්ත්‍රික්ක සංඛ්‍යාව කොපමණද?

(9) කාන්තාවන්ට එරෙහිව සියලුම ආකාරයේ වෙනස්කම් කිරීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය හඳුන්වන කෙටි නාමය කුමක්ද?

(10) වැඩ කරන ජනතාව වෙනුවෙන් සමාජ සාධාරණත්වය ඉටු කිරීම අරමුණු කරගෙන 1919 දී පිහිට වූ සංවිධානයේ නම කුමක්ද?

(ලකුණු 2 x 10 = 20)

- ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

(1) (i) පළාත් ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ කෙසේද?

(ii) පළාත් ආණ්ඩුකාරවරයාගේ බලතල හා කාර්යයන් මොනවාද?

(iii) පළාත් මහ ඇමතිවරයා පත් කරනු ලබන්නේ කෙසේද?

(iv) පළාත් මහ ඇමති ඇතුළු අමාත්‍ය මණ්ඩලයේ කාර්යයන් මොනවාද?

(2) (i) බහු සංස්කෘතික ජන සමාජයක් යනු කුමක්ද?

(ii) බහු සංස්කෘතික ජන සමාජයක මූලික ලක්ෂණ මොනවාද?

(iii) බහු සංස්කෘතික සමාජයක් බිහිවීම කෙරෙහි බලපා ඇති සාධක මොනවාද?

(iv) යහ පාලනය සංකල්පය මතුවීමට බලපෑ ප්‍රධාන හේතු මොනවාද?

(3) (i) නීතිය වර්ග කොට දක්වන්න.

(ii) නීතියේ පවතින ප්‍රධාන ගුණාංග හතරක් දක්වන්න.

(iii) නීතියේ මූලාශ්‍රයන් දක්වා ඒ පිළිබඳව සැකවින් දක්වන්න.

(4) (i) ශ්‍රී ලංකාවේ වර්තමාන අධිකරණ පද්ධතිය රූප සටහනක් ඇසුරෙන් දක්වන්න.

(ii) ශ්‍රේෂ්ඨාධිකරණය සතුවන ප්‍රධාන කාර්යයන් මොනවාද?

(iii) ආරවුල් විසඳීමේ විකල්ප ක්‍රම මොනවාද? ඒවායින් එක් ක්‍රමයක් පිළිබඳව විස්තර කරන්න.

(5) (i) වර්තමාන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන මොනවාද?

(ii) මෙම පළාත් පාලන ආයතනවලට පොදුවේ හිමිවන බලතල මොනවාද?

(iii) පළාත් පාලන ආයතන වලින් ඇති ප්‍රයෝජන මොනවාද?

(6) (i) අයිතිවාසිකම් යනු කුමක්ද?

(ii) අයිතිවාසිකම් වර්ග කොට දක්වන්නේ කෙසේද?

(ii) පවුලේ සාමාජිකයකු ලෙස පාසලේ සාමාජිකයකු ලෙස උසස් අධ්‍යාපන ආයතනයක සාමාජිකයකු ලෙස ඔබ විසින් ඉටු කළ යුතු යුතුකම් වෙන වෙනම සඳහන් කරන්න.

(7) (i) පරිසරය යනු කුමක්ද?

(ii) පරිසරයෙන් ලැබෙන සේවාවන් මොනවාද?

(iii) මිනිසා පරිසරය වෙනස් කිරීමට යොමු වී ඇත්තේ ඇයි?

(8) (i) ජල දූෂණය යනු කුමක්ද ?

(ii) ජලය දූෂණය සිදුවන අවස්ථා මොනවාද?

(iii) ජලය දූෂණය වීමෙන් ඇතිවන ගැටලු මොනවාද?

(ලකුණු 10 x5 = 50)